පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I , II

විෂයය :- ..............................................................................

පාසලේ නම : ..............................................................................

ඇතුළත්වීමේ අංකය : ................................ කාලය : පැය 03 යි

*සැලකිය යුතුයි*

- ***සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු 40 කි.***
- ***අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1), 2), 3), 4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.***
- ***ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.***

---

**අංක 01 සිට 03 දක්වා ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.**

01. දැනුම මිනුම තරගයෙන් ප්‍රථම ස්ථානය දිනාගත් ශිෂ්‍යයා **පොත් ගුල්ලෙකි.**
    1) පොත්පත් ලියන්නෙකි.
    2) පොත්පත් එක්රැස් කරන්නෙකි.
    3) නිතර පොතපත පරිශීලනයේ යෙදෙන්නෙකි.
    4) පොත්පත්වල සිටින කුඩා කෘමියෙකි.

02. **දිනන පිළට කොඩිය දීම** අවස්ථාවාදීන්ගේ සිරිතයි.
    1) දිනන පක්ෂය බලා එකතු වීම.
    2) තෑග්ගක් ලෙස කොඩියක් දීම.
    3) පිලේ කොඩියක් සිටුවීම.
    4) ජයග්‍රහණය සංකේතවත් කිරීමට කොඩියක් දීම.

03. පවත්නා ආර්ථික තත්ත්වය හමුවේ **හරි හතරැස් විදියට** අවශ්‍යතා ඉටුකර ගත නොහැකි බව අප වටහා ගත යුතුය.
    1) චතුරස්‍රාකාර ලෙස          2) අංග සම්පූර්ණ ලෙස
    3) වැරදි ආකාරයට          4) පැහැදිලි ආකාරයට

**අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. ටී.ජී.ඩබ්. ද සිල්වා ...................................... කතා ලියූ කෙටිකතාකරුවෙකි.
    1) ගුණාත්මක          2) ප්‍රමාණාත්මක          3) විමර්ශනාත්මක          4) උපහාසාත්මක

05. ජනාධිපතිතුමා නව ව්‍යාපෘති පිළිබඳ ..................................... වාර්තාවක් ඉල්ලා සිටියේ ය.
    1) කලාත්මක          2) විස්තරාත්මක          3) උසස්          4) වර්ණවත්

06. උසස් කෙටිකතාකරුවා වටිනා අදහස් සමුදායක්, එක් ප්‍රබල ..................................... මගින් පාඨකයා වෙත මුදාහරියි.
    1) සිද්ධියක්          2) ආකෘතියක්          3) වර්ණනයක්          4) සන්තාපයක්

07. ඕෂ්ඨජ අක්ෂර පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
    1) ඉ, ඊ, ප, එ, බ          2) අ, ආ, හ, බ, ම          3) උ, ඌ, ප, බ, ම          4) ඇ, ඈ, බ, ම, ප

08. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
    1) ව්‍යංග්‍යාර්ථය, රිද්මයානුකූල, නීත්‍යානුකූල, කොට්ඨාශය
    2) පුස්තකාලය, සූර්ය්‍යයා, කරුනු, උපකරණ
    3) නිශ්ශබ්දතාව, අත්‍යාවශ්‍ය, විද්‍යුතය, පරිණාමය
    4) අවස්ථෝචිත, රිද්මානුකූල, ප්‍රස්තාවනාව, ස්වභාවික

09. අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.
1) ජනාධිපති, ජනප්‍රවාද, ජලජ, ජාතිකාභිමානය 2) කනක, කාන්දම, කුඩුව, කෝදුව
3) සමුදුර, සාහිත්‍යය, මාරුතය, රුවල 4) කුලසිරි, කුලරත්න, කුලතුංග, කුලවංශ

10. එක් එක් වචනයෙහි දෙවන අකුරෙහි කෙටි ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, ගැට ඇලපිල්ල, කෙටි ඇදපිල්ල පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
1) සපිරි, නුදුරු, අගුරු, ඔරුව 2) තුසිතය, විරූඪ, නිකෘෂ්ට, පැහැදිලි
3) අක්වැස්ස, ස්වරූප, අපෘෂ්ට, රැහැයියා 4) ගණිතය, අරුණ, දවාල, පිඩැල්ල

11. ''වීරයෙක්'' යන පදය අයත් වන්නේ,
1) ස්වර සන්ධියට ය. 2) පූර්ව රූප සන්ධියට ය.
3) ආගම සන්ධියට ය. 4) ගාත්‍රා දේශ සන්ධියට ය.

12. ''ප්‍රසංග + ඉක'' ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සෑදෙන නිවැරදි පදය වන්නේ,
1) ප්‍රාසාංගික 2) ප්‍රසංගික 3) ප්‍රාසංගික 4) ප්‍රසාංගික

13. ප්‍රථම පුරුෂ උක්ත නාම පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1) කතුවරු, ගැමියෙක්, ඔවුහු, බාලිකාවෝ 2) ඔවුහු, ඇත්තු, සෙබළුන්, මුවන්
3) නුඹ, අපි, ඔවුන්, තොපි 4) මම, සිංහයෝ, ඇය, ඔවුන්

14. ''ප්‍රාදේශීය ලේකම්තුමා නිලධාරීන් ලවා ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරවයි'' යන වාක්‍යයේ 'කරවයි' යන පදය අයත් වන ක්‍රියා වර්ගය වන්නේ,
1) පූර්ව ක්‍රියා 2) අසම්භාව්‍ය ක්‍රියා 3) මිශ්‍ර ක්‍රියා 4) ප්‍රයෝජ්‍ය ක්‍රියා

**අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

15. සිවුපද කාව්‍ය සම්ප්‍රදාය **අතික්‍රමණය** කිරීමක් ලෙස නිසඳැස් පද්‍ය සම්ප්‍රදායේ බිහිව ඒම දැක්විය හැකිය.
1) සමාන්තරව යාම 2) ඉක්මවා යාම 3) පහළට ගමන් කිරීම 4) ගලා යාම

16. තම මව්බිමට කීර්තියක් ලබාදීමේ **පරමාභිලාෂයෙන්** කටයුතු කළ ක්‍රීඩකයා තරගය ජය ගත්තේය.
1) උතුම් අරමුණෙන් 2) අන්‍ය අරමුණකින් 3) උසස් ආශාවෙන් 4) හිතවත් හැඟීමෙන්

17. අනගාරික ධර්මපාලතුමා බෞද්ධ ආගම නගා සිටුවීමේ කාර්යයේ දී **පුරෝගාමී විය.**
1) මැදිහත් විය 2) සහාය විය 3) නිරත විය 4) මුල් විය

18. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත පිළිතුරු තෝරන්න.
1) නිපාත - මෙන්, සේ, බඳු, කැටුව
2) නාම ප්‍රකෘති - මිනිස්, ඉබි, ගිරා, බකමූණු
3) උපසර්ග - උප, අනු, අති, නිති
4) ක්‍රියා ප්‍රකෘති - කර, හඬ, බල, නට

19. මිශ්‍ර ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.
1) ගායිකාව ගී ගයා රසිකයන් පිනවූවා ය.
2) සංචාරකයෝ වනසිරි නරඹමින් ගමන් කළහ.
3) මහලු කත පාරේ හෙමින් ගමන් කරයි.
4) ගොවියෝ රට වෙනුවෙන් කය වෙහෙසා වැඩ කරති.

20. මුලින් දී ඇති පදයට සමානාර්ථ නොදෙන පදයක් සහිත පිළිතුර තෝරන්න.
1) මුහුද - සිඳු, සාගරය, ආකරය, රුවනාර
2) නොයෙක් - නෙක, විවිධ, අනේක, නා නා
3) බිඳුණු - බුන්, කඩ, ඛණ්ඩිත, හින්න
4) රශ්මි - කිරණ, කැලුම්, රැස්, කර

21. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇති වරණය තෝරන්න.
1) රළු - පරළු 2) අශ්වයා - හය 3) ආධුනික - ප්‍රවීණ 4) රැවුම් - ගෙරවුම්

22. පෙළ පොතෙහි ඇති පහත සඳහන් පද්‍ය නිර්මාණ හා එහි කතුවරයා නිවැරදිව දැක්වෙන වරණය වනුයේ
1) පෙර රජ දවස ලංකාව - ධර්මසිරි රාජපක්ෂ මහතා ය.
2) රත්න දීප ජන්ම භූමි - ගුණදාස අමරසේකර මහතා ය.
3) මිය ගිය උවැසිය - රත්න ශ්‍රී විජේසිංහ මහතා ය.
4) හඳ සහ නිව්යෝර්ක් නුවර - මහගම සේකර මහතා ය.

23. පාඩම් මාතෘකා පිළිවෙළින් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
- ***"අනේ කියන්න මාමේ, එතකොට ඒ ගැන අපි යාළුවන්ටත් කියන්නම්."***
- ***"ඇස්වහක් කටවහක් එපා, දොස්තර මහත්තයා දෙන බෙහෙත්වලින් ලෙඩේ නිට්ටාවට සනීප වෙනවා."***
- ***"හැබෑට ! මට වැරදිලා ! හ්ම් දැන් නම් ඉතින් කරන්න දෙයක් නෑ".***
- ***"සර්ලා ළඟදී නේද මේ පළාතට ආවේ?"***

A - ආපදා කළමනාකරණය B - නාට්‍ය පිටපත් රචනය
C - මහාචාර්ය සේනක බිබිලේ D - මං තනන්නෝ

1) ACBD 2) CBDA 3) DACB 4) ABCD

24. නිවැරදි අදහස සහිත වරණය තෝරන්න.
1) දැගිලි, ගාත්‍රාදේශ සන්ධියට යත් පදයකි.
2) කර්ම කාරක වාක්‍යයක කර්මය උක්ත වේ.
3) නූතන සිංහල අක්ෂරමාලාවේ ඌෂමාක්ෂර හතරකි.
4) අප්‍රාණවාචී බහුවචන නාම පදයක් උක්තය ලෙස යෙදෙනවිට ආඛ්‍යාතය බහු වචනයෙන් තැබිය යුතුය.

25. සෑම පදයක ම තාලුජ අක්ෂරයක් යෙදී ඇති වරණය තෝරන්න.
1) ඊශ්වර, සජ්ඣායනා, ඡන්දය, ගායනය 2) ඉඟුරු, චලිතය, කලපුව, තත්කාලීන
3) වාර්ගික, නිරෝගී, දේශාටනය, පිපාසඥා 4) ජනාවාස, අභිෂේක, විනිශ්චයකරු, නිරාමිස

26. පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් සෑදෙන ග්‍රන්ථ නාමය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
1) ලි, පූ, චා, ය, ව 2) බා, රා, ය, ල, මා, ය, ණ
3) ලි, ස, ණි, ක්, ටා, හ 4) ග, ර, ළි, මි, පා, ය

27. නිවැරදි විසන්ධි පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
1) හෙළ + ඕ, වයස් + ඇති, කළඳ + දෙක
2) සත් + නස, සුල් + ඇඟිල්ල, පැහැ + ඇති
3) ගම් + ගොඩ, සිත් + කරු, නෙළුම් + මල්
4) පිළි + උතුරු, දකුණු + අත, උපන් + නූපන්

28. නිවැරදි සන්ධි පදය දැක්වෙන වරණය තෝරන්න.
1) ඇත්හල 2) ජාත්‍යන්ධ 3) අභ්‍යාවකාශ 4) මල්සුන

**අංක 29 හා 30 ප්‍රශ්න සඳහා දී ඇති අදහසට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

29. තීරණයක් නොගෙන සිටීම
1) අහසට ඉණිමං බඳිනවා වගේ 2) කොටි වලිගය අල්ලගත්තා වගේ
3) කළුවා මාරපං ගියා වගේ 4) එළිපත්ත උඩ ඉන්න බළලා වගේ

30. පමණ දැනගෙන කටයුතු කරන්න.
1) පනින්න පෙර සිතා බලනු 2) උපාය දන්නෝ අපායේ නොවැටෙති
3) කඩුල්ලේ තරම දැනගෙන කඳ බඳිනු 4) දේසේ හැටියට බාසේ

31. A - මිනිසුන් - ස්වර සන්ධි B - එක් අයෙක් - නිත්‍ය බහුවචන
C - ය, ර, ල, ව - අන්තඃස්ථාක්ෂර D - කොලු, බල, මිනිස් - නාම ප්‍රකෘති

ඉහත A,B,C,D යෙදුම් අතුරින් නිවැරදි වන්නේ,
1) A හා D ය 2) B හා C ය 3) A හා C ය 4) A හා B ය

**අංක 32, 33, 34 යටතේ දී ඇති වාක්‍යවලින් ව්‍යාකරණානුකූලව ම නිවැරදි වාක්‍ය තෝරන්න.**

32. 1) ඔවුහු අසරණයන්ට උදව් කරනු යෙහෙකි. 2) ඕ තුමූ නගරයට ගියා ය.
3) ශිෂ්‍යයන් ප්‍රදර්ශන භූමියට පැමිණ නැත. 4) නදී තොමෝ සෙමෙන් ගලා බසින්නී ය.

33. 1) දේශපාලඥයන් අවංක නොවන්නේ ඇයි?
2) එක් කෙනෙක් නාට්‍යයේ රඟ පෑහ.
3) කසුන් ද මම ද සම්මුඛ පරීක්ෂණයට සහභාගී වෙමි.
4) වෛද්‍යවරුන් මිනිස් ජීවිත රැකිය යුත්තා හ.

34. 1) ශිෂ්‍ය නායකයන් විසින් ළමයි පෙළ ගස්වනු ලබති.
2) සියලු ක්‍රීඩකයෝ ප්‍රතිඥා දීම මැනවි.
3) වෘක්ෂලතාවෝ සුළඟට ඉදිරි වැටෙයි.
4) රට වැසියෝ පාරට බසිති'යි, පාලකයෝ සැක කළහ.

35. පහත දැක්වෙන ප්‍රකාශය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වාක්‍ය සහිත වරණය තෝරන්න.
*''සමහරදාට මා රෑට මිදුලට බැහැලා අහස දිහා බලාගෙන ඉන්නවා''*
1) සමහර දිනවල මම රෑට මිදුලට බැස අහස දිහා බලා සිටිමි.
2) මම සමහර රාත්‍රියට මිදුලට බැහැලා අහස දෙස බලා සිටිමි.
3) මම සමහර දිනවල මිදුලට බැස රාත්‍රියට අහස දිහා බලාගෙන සිටිමි.
4) මම සමහර දිනවල රාත්‍රියට මිදුලට බැස අහස දෙස බලා සිටිමි.

36. අංකිත පදවල අර්ථය නිවැරදිව පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
*<u>**ලකළ**</u> ගුවන්තල සිරි ගහන* *<u>**නිකසල**</u>*
*<u>**අතුළ**</u> කුසුම් විලසින් සැළෙන* *<u>**තුරුවැල**</u>*

1) සෞම්‍ය, සෝබමාන, අහස්තලය, තාරුකා පන්තිය
2) අලංකාර, නිර්මල, අතුරනලද, තාරුකා පන්තිය
3) අපූර්ව, නිර්මල, අතුවල, ගස්වැල්
4) බබළන, අලංකාර, සෞම්‍ය, තුරුලතා

37. ''මැටිකෝවා'' නම් උපකරණය භාවිතා කරනුයේ,
1) මැටි කර්මාන්තයේය. 2) ලෝහ කර්මාන්තයේ ය.
3) රන් කර්මාන්තයේ ය. 4) කෘෂි කර්මාන්තයේ ය.

38. රූපකයක් සහිත වරණය තෝරන්න.
1) රන්මලක් ලෙස දෙව් බඹුන් දෝතින් පිදූ මේ පින් බිමේ
2) සුදු පරවි රෑන සේ පියාසලා
3) පින්න මුතු වගේ මල් මත නටනු ලස්සනයි
4) ගලන ගඟකි ජීවිතේ දයා ලූ ලෝකයේ

39. මෙහි උපමානය හා උපමේය නිවැරදිව පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
***''වෙරළ දිගේ සැරසිල්ලක් මෙන් හරිත වර්ණ ශාකයෝ පෙනෙන්නට වූහ.''***
1) හරිත වර්ණ - ශාක 3) වෙරළ - සැරසිල්ලක්
2) සැරසිල්ලක් - ශාක 4) ශාක - හරිත වර්ණ

40. පහත සඳහන් පද්‍ය ඛණ්ඩයෙහි අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.
***සොඳුරු තුරුණු සියපත් සිය රස් වතුර***
***ඉඳුරු දෙසින් වැද නුබ ගඟ එත පැතිර***
1) සුන්දර වූ තරුණ සූර්යයාගේ රශ්මිය නැමති ජලය නැගෙනහිර දිශාවෙන් ආකාශ ගංගාවට මැදී පැතිරෙන කල්හි.
2) සුන්දර වූ තරුණ සූර්යයාගේ රශ්මිය නැමැති වතුර දිව්‍ය ලෝකය දෙසින් ආකාශ ගංගාව කරා පැතිර ගොස්
3) සුන්දර වූ තරුණ නෙළුම් මල් සිය රශ්මි නම් ජලය නැගෙනහිර දිශාවෙන් විහිදුවන ආකාශ ගංගාව කරා පැතිර ගොස්
4) සුන්දර වූ තරුණ නෙළුම් මල් වල පෙති ජලය මත පා කර දිව්‍ය ලෝකය දෙසින් ආකාශ ගංගාව කරා පැතිර යද්දි

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II පත්‍රය

**ප්‍රශ්න සියල්ලටම උත්තර සපයන්න.**

**01. අංක 1 සිට 10 තෙක් ඇති සියලු ම ප්‍රශ්නවල අනු කොටස් සියල්ලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

1) පහත සඳහන් පද වල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
අ) වල ආ) වළ

2) පහත සඳහන් විසන්ධි පද සන්ධි කොට ලියා දක්වන්න.
අ) මඟ + මුළ ආ) මත් + හල

3) පහත සඳහන් පදවල අරුත ලිහිල් බසින් ලියන්න.
අ) විස්මයාවහ ආ) පරිපෝෂිත

4) ***''මෙවර ක්‍රිකට් ලෝක කුසලාන තරගාවලියේ විකාශණ අයිතිය පිලිබඳව මතවාදයන් ගොඩ නැගී ඇත.''***
ඉහත ප්‍රකාශයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය වැරදි ය. එම පද දෙක පමණක් නිවැරදි කොට ලියන්න.

5) පහත වාක්‍යයේ ඇති නිපාත හා උපසර්ග පද එක බැගින් වෙන් කොට දක්වන්න.
***''සුන්දර යුවතිය විරල රෝගයෙන් අසාධ්‍යව මිලාන වූ කුසුමක් මෙන් දිස් විය.''***
අ) ආ)

6) ''ප-එ-ඹ-හ-ම'' යන අකුරු හැඳින්වීමට යෙදිය හැකි නම් දෙක ලියන්න.

7) ***''ඇතැම් යුගල පදවල එක් පදයක අර්ථය පැහැදිලි නැත. නමුත් එය අනෙක් පදයේ අර්ථය තීව්‍ර කිරීමට ඉවහල් වේ.''*** මෙවැනි යුගල පද දෙකක් ලියා දක්වන්න.
අ) ආ)

8) පහත සඳහන් වාක්‍ය දෙක කර්ම කාරකයට හරවා ලියන්න.
අ) අධ්‍යක්ෂතුමා විද්‍යාලයීය නව ගොඩනැගිල්ල විවෘත කරයි.
ආ) ළමයි විනෝදයට චිත්‍ර අඳිති.

9) ''මාමා අම්මා බැලීමට ***<u>ආවුත්</u>*** නිවසට ***<u>ගියෝතින්</u>*** නැන්දා කෝප වන්නීය'' මෙහි අංකිත පද අයත් ක්‍රියා වර්ග ලියා දක්වන්න.
අ) ආ)

10. මොනරාගල ප්‍රදේශයේ භාවිත වන පහත වචනවල සාමාන්‍ය අරුත ලියන්න.
අ) යාකොය් ආ) කුදහන්නැතුං

**(ලකුණු 2x10=20යි)**

**02. පහත අ-ආ-ඉ-ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු රචනාවක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ යොදන්න.**

අ) පාසල් සමාජයේ සාරධර්ම පිරිහෙමින් තිබෙන බවත් දැන් දැන් නිතර අසන්නට ලැබේ. පාසලක් විවෘත කිරීම සිර ගෙයක් වැසීමකි යන උපදේශනාත්මක ප්‍රකාශනයක් ද ඇත. අතීතයේ දී මෙන්ම අද ද පාසල් අධ්‍යාපන අරමුණු අතර ශිෂය විනය මූලික වේ. එහෙත් එකී මූලික අරමුණු ඉටුකර ගැනීමට අද විවිධ බාධා මතුව ඇත. මේ ගැන සැමගේ අවධානය යොමු විය යුතුය. **(ලකුණු 25යි)**

ආ) පැරණි ශ්‍රී ලාංකිකයා සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවකට උරුමකම් කීමේ ඔහුගේ දෛනික කටයුතු ඊට ගැලපෙන පරිදි සකස් කරගත් නිසාය. කය වෙහෙසා වැඩ කරමින් ඔවුහු ජීවිකාව සපයා ගත්තෝය. වසවිසවලින් තොරව ආහාර තමාම නිෂ්පාදනය කරගනී. එසේ පැවති ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය වාණිජවාදි බලපෑම් නිසා අභිමිවනවාත් සමග වත්මන් ජන ජීවිතය කාර්ය බහුල තරගකාරී තත්ත්වයකට හැඩ ගැසී ඇත. ඒ නිසාම ක්ෂණික ආහාර කෘෂි රසායන භාවිතය ද නිරෝගීතාවයට බලපෑම් ඇති කරයි. නිරායාසයෙන් ලැබෙන කායික ව්‍යායාම අද ඇත්තේම නැති තරමය. එකී ප්‍රධාන ප්‍රතිඵලය වී ඇත්තේ බෝ නොවන රෝග ව්‍යාප්තිය වැඩි වීමයි. එය රටේ සංවර්ධනයට ප්‍රබල බලපෑමක් ඇති කරයි.

**(ලකුණු 25යි)**

ඉ) ඉතිහාසගත තොරතුරු අධ්‍යයනය කරන විට අතීත වෛද්‍ය ක්‍රමය ඉතා දියුණු තත්ත්වයකට පත් වී තිබිණි. එහෙත් බටහිර ජාතීන් අප රට ආක්‍රමණය කරන විට දේශීය වෛද්‍ය ක්‍රමයට කණකොකා හඬන්නට විය. එහෙත් වර්තමානයේ පවා දේශිය වෛද්‍ය ක්‍රමයේ හාස්කම් ගැන නිතර අසන්නට ලැබේ. තිබෙන පහසුකම් වැඩි කොට තරගකාරී ලෙස දේශීය වෛද්‍ය ක්‍රමය නගා සිටුවීමට අවශ්‍ය පියවර ගත යුතුව ඇත.

**(ලකුණු 25යි)**

ඊ) අපේ ගම ළඟම ඇති මොර කැලෑවට යහළුවන් සමඟ යෑම පුරුද්දක් කොට ගතිමි. ඈත නොගොස් පලු, වීර කැමත් නොයෙක් කුරුල්ලන් වන සතුන් දෙස බලා ඒම අපේ ප්‍රබල විනෝදාංශයකි. ක්‍රමයෙන් බිය නැති වූ අප එක් දිනක් වනාන්තරය ඇතුළට යෑමට තීරණය කළෙමු. වැටී ඇති එළිමහන් තැන්වලින් ඇති වනයට පිවිසියෙමු. ඇතට ගිය අපට හමුවූයේ විශාල අලියෙකි. මම අන් අයගෙන් වෙන් වී ඈතට දිව ගියෙමි. මම වනාන්තරයේ තනිවීමි.

**(ලකුණු 25යි)**

**03. පහත දැක්වෙන පාඨය වචන 50-60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග ලියන්න.**

නිදහස් විවෘත ආර්ථිකය දොර පියව හැර දැමීමත් සමඟ සිව්දෙසින් ගලා ආ නව ආර්ථික, සාමාජික සිතුවිලි මෙරට මුල් බැස ගන්නට උත්සාහ දරන්නේ විශාල තරගයකට මග පාදිමිනි. මේ තරගයට මුහුණු දීමේ දී බොහෝ රටවල් සිය පාරම්පරික සංස්කෘතික උරුමය උගසට තබා නැත. එසේ උගසට තැබූ ඇතැම් රටවල් පවා එය සින්න වී යාමට පෙර බේරා ගෙන තිබේ. ජපානය අද ආසියාතික රටවල් අතර පමණක් නොව මුළු ලේකයේ ම යෝධ ආර්ථික බලවේගයන්ගෙන් එකක මෙම ආර්ථික බලවේගවලට ජපන් ජන ජීවිතයේ සුකුමාර ස්වභාවය සුක්ෂමාත්මතාව එහේ පිටින් ම ගිල ගන්නට හැකි වී නැත. බටහිරින් පැමිණි බොහෝ සංස්කෘතික, සමාජික ලක්ෂණ ජපන් ජන ජීවිතයට එක් වී ඇත්තේ බෝතලයකට වැටෙන දිය එහි හැඩය ගන්නා සේ ය. නව ලෝකයක් සමඟ පෙරමුණ ගැනීමට නැගිටින හැම දේශයක් ම පාහේ සිය පාරම්පරික උරුමවලට පයින් ගැසීමට උත්සාහ දරන්නේ නම් මහත් ධෛර්යයෙන් හෝ ලබාගන්නා සංවර්ධනයේ ඵල භුක්ති විඳීමට ඔහුන්ට අවස්ථාවක් ලැබෙන්නේ නැතැයි සුප්‍රකට බටහිර මානව විද්‍යා මිල්ටන් සිංගර් පෙන්වා දී තිබේ. සමාජ ආර්ථික විප්ලවයකට ලක ලෑස්ති වෙමින් සිටින අපි අපේ පාරම්පරික උරුම රැක ගැනීමටත්, ඒවා තවදුරටත් සංවර්ධනය කරලීමටත් උත්සාහ දැරීම මේ යුගයේ පැවරී ඇති කාර්යයකි.

**(ලකුණු 10යි)**

04. මෑතක සිට මානව හිමිකම් පිළිබඳව පිබිදීම බහුලව දක්නට ඇත්තේ නෛතික හා සමාජීය ස්වරූපයෙන් යැයි පෙන්වා දිය හැකි වුවත් මේ ප්‍රශ්නය ගත වර්ෂ කීපයක් ඈත දිවෙන ඉතිහාසයක් ඇති බව අමතක කළ යුතු නොවේ. කාර්මික විප්ලවයට පෙර සමාජය, දැඩි කුලුපග බවකින් තම කටයුතුවල නිරත විය. මහජනයා ප්‍රශ්න වෙත යොමු වූයේ තනි තනිව නොවේ. ඒ හේතුකොටගෙන මුළු සමාජය ම තෘප්තිමත් ජීවිත ගත කළ බව පෙනේ. ඇති නැති පරතරය බරපතල ප්‍රශ්නයක් නොවීය. කවුරුත් කාගේත් ශුභ සිද්ධිය තකා අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුක්තව ක්‍රියා කළහ. කාර්මික විප්ලවයේ අනිෂ්ට විපාක වශයෙන් වියැකී ගිය මේ ඒකාබද්ධතාව විසින් එක් එක් පුද්ගලයා තුළ ස්වාර්ථ සිද්ධිය කෙරේ දැඩි ඇල්මක් ජනනය කරන ලදී. සමාජ ශුභ සිද්ධිය පමණක් නොව ස්වියත්වය ගැනම

සැළකිලිමත්වීම වැනි පිළිවෙත් කෙරෙහි උනන්දුවක් නොදැක් වූ කෘත්‍රිම ස්වරූපයක් සමාජයට ඇතුළු වීම ජනයාගේ සිතුම් පැතුම් භෞතික අංශය වෙත යොමුවීම තවත් ලක්ෂණයකි. මේ වූ කලී ආධ්‍යාත්මික ගුණ වගාව, සාරධර්ම සමාජ ව්‍යුහයන් ගිලිහී යාමට විවර වූ දොරක් විය. පුද්ගලයා මතු විය. සමාජය යට ගියේය. පසු කාලයේ බලවතුන්ගෙන් සැදුණු නව ශ්‍රේණි විසින් මානව හිමිකම් පස්සට තල්ලු කර දැමීමේ ප්‍රතිඵලය වූයේ අලුත් ප්‍රශ්න පැන නැගීමයි.

1) මානව හිමිකම් පිළිබඳ උද්ඝෝෂණ වර්තමානයේ උද්ගත වී ඇත්තේ කවර අංශවලින් ද ?

2) මානව හිමිකම් පිළිබඳ ප්‍රශ්නයේ මූලාරම්භයට හේතු කාරක වූ සංසිද්ධිය කුමක් ද ?

3) කාර්මික විප්ලවයට පෙර සමාජයේ ලක්ෂණ 2ක් ලියන්න.

4) ''පුද්ගලයා මතුවිය'', ''සමාජය යට ගියේය'' යන ප්‍රකාශයේ ගැබ්ව ඇති සමාජ ලක්ෂණය ලියන්න.

5) ''වියැකී ගියා'', ''ස්වාර්ථ සිද්ධිය'' යන්නේ තේරුම ලියන්න.

**(ලකුණු 10යි)**

**05. වෙළඳ දැන්වීම් නිර්මාණය කරන අයතනයක ප්‍රධානියා ඔබ යැයි සිතන්න. ''සිතුවිලි ලීසිං සමාගම'' මඟින් පුවත්පතක පළ කිරීමට සුදුසු වෙළඳ දැන්වීමක් පිළියෙල කිරීමට ඔබට පවරයි. එහිදී ඔවුන් දුන් තොරතුරු පහත පරිදි වේ.**

- ✓ අවුරුදු 5ක කාල සීමාව, අවම ලියකියවිලි හදිසි අවස්ථාවක විශේෂ සහන, කඩිනම් සේවය, ජංගම නඩත්තු සේවයක් පැවතීම, නඩත්තු බිල්පත් සඳහා විශේෂ වට්ටම්
- ✓ සිතුවිලි ෆිනෑන්ස් සමාගම, පැරකුම් වීදිය, කුරුණෑගල, 037-2269968

**මේ අනුව සුදුසු වෙළඳ දැන්වීමක් පිළියෙල කරන්න.**

**(ලකුණු 15යි)**

**නැතහොත්,**

''අවුරුදු පතා කරන කටයුත්ත මේ අවුරුද්දෙත් හොඳට කරන්නොනෑ''
''ඔව්, ගිය අවුරුද්දේ කලා වගේ''
''මේ සැරේ අපි ගමේ පාසල් පාර හදමු''
''ඕව්, පාරේ හැමතැනම වලවල්. දෙපැත්තේ කාණුත් වැහිලා. යන්තම් වැස්සක් ආවොත් මඩ වෙනවා''
''ගමේ ඔක්කොම එකතු වුණොත් බැරි කමක් නෑ''
''මේකට අපේ සමිතියයි පෙරමුණ ගන්න ඕනෑ''
''එතකොට ශ්‍රමදානයට සහභාගී වන අයට කෑම බීම''
''සමිතියේ අරමුදලෙන් හෝ දෙමු''
''පාන් ගෙඩි 50ක් 60ක් බේකරියෙන්ම ගන්න පුළුවනි''

**ඉහත දැක්වෙන්නේ සමනළ ගමේ ''පිවිතුරු සිතුවිලි'' සුභ සාධක සංගමයේ කාරක සභා අවස්ථාවේ ඇති වූ කතාබහකි. ඉන් අදාල කරුණු ගෙන ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට හැකි වචන 125ක් පමණ ඇතුළත් අත්පත්‍රිකාවක් පිළියෙල කරන්න.**
(ශ්‍රමදානයට අවශ්‍ය දෑ ද රැගෙන ඒමට දැනුවත් කරන්න)

**(ලකුණු 15යි)**

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය **10**

# තෙවන වාර පරීක්ෂණය - 2023

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III පත්‍රය

ශිෂ්‍යයාගේ නම ........................................................................................ කාලය : පැය 02යි

- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.**
- **1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80කි.**

01. 1 සිට 10 තෙක් ඇති සියලු කොටස්වලට කෙටි උත්තර සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය යොදා ඉදිරියෙන් ඉරක් අඳින්න.

1) *ශක්ති සම්පන්න පුරුෂයෙක් කච්චිය තර කොට හැදගෙන ගඟට බැස...*
   - අ) මේ පාඨය උපුටාගත් කෘතිය කුමක්ද ?
   - ආ) මෙම පාඨය ඇතුළත් කතා වස්තුව කුමක්දැයි ලියා දක්වන්න.

2) ***මී අඹ කිරල මාදම් ගෙඩි ළදරු වියේ***
   ***ඇකයෙහි හෙළා හඬවයි සැඩ සුළඟ රැයේ***
   ***සුළි මැද කැරකෙමින් ඉඳුනිල් ගැඹුරු දියේ***
   ***සමහර තැනක ලස්සන මල් කැකුළු තියේ***
   - අ) මෙම කවිය ඇතුළත් කවි පංතියේ රචකයාගේ නම කුමක් ද ?
   - ආ) එතුමාගේ ජනප්‍රිය කාව්‍ය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

3) ***සැප සයනා සුවඳ බොජුන්***
   ***තුමුල මාලිගා***
   **......................................................**
   **......................................................**
   - අ) මෙය උපුටාගත් නාට්‍ය නම් කරන්න.
   - ආ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

4) *''මිනිහා අනුමානයක් නෑ මැරෙන්ඩ ඇති''*
   - අ) මේ ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දක් ද ?
   - ආ) මෙය ඇතුළත් ග්‍රන්ථයේ කතුවරයාගේ නම කුමක් ද ?

5) 
   - අ) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙස උගන්වනු ලැබූ විෂයයන් මොනවාද ?
   - ආ) උන් වහන්සේ උපසම්පදාව ලද්දේ කිනම් නිකායික භික්ෂුවක් ලෙසද ?

6) 
   - අ) ජාතක කතා ඇසුරු කරගෙන ලිය වී ඇති ගී කාව්‍ය පොත් දෙකක් නම් කරන්න.
   - ආ) උම්මග්ග ජාතකයේ සතර කන්මන්ත්‍රණය සිදුවන්නේ කවුරුන් අතරද ?

7) 
   - අ) ගුත්තිල කාව්‍ය ඇතුළත් වන්නේ කුමන සාහිත්‍ය යුගයට ද ?
   - ආ) මෙය රචනා කිරීමට ආරාධනා කළේ කවුරුන්ද ?

8) 
   - අ) කෙළි සෙල්ලම් ඇසුරෙන් නිර්මාණය වූ ජන කවි වර්ග දෙකක් නම් කරන්න.
   - ආ) ''භානාභීය පානා අඬහැරෙන් දැනේ'' යන කවිය ඇතුලත් වන්නේ කුමන ජන කවි වර්ගයටද ?

9) 
   - අ) ''Monks House''නම් ස්ථානයේ ලෝකඩ ස්මාරකයක් සකස් කළේ කවුරුන් වෙනුවෙන්ද?
   - ආ) එතුමාගේ ජීවිතයේ 1912 දී සිදු වූ විශේෂ සිදුවීම කුමක්ද ?

10. ***ජාතිය රන් විමනක් වේ - ආගම මිනි පහණක් වේ***

***.....................................................................................................***

අ) ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ආ) මෙම කවිය ඇතුළත් කවි පංතියේ රචකයාගේ දේශාභිමාන කවි පංතියක නමක් ලියා දක්වන්න.

**(ලකුණු 2x10=20යි)**

02. පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1) ***''දේවයිනි, මහත් වූ කෝලාහල ශබ්ද ඇපි කුමක් බවත් නොදනුම්හ''***

අ) මෙහි ඇපි යනුවෙන් හඳුන්වන අය කවුරුන්දැයි නම් කරන්න.

ආ) මෙය කුමන අවස්ථාව හා සම්බන්ධ කොටසක් ද ?

2) ''තත මතු ද සින්දේ - **පිළිමල්** දප ද සින්නේ

යස දිගත ඇන්දේ - විජය **සිරි සඳ** ගෙන වැලැන්දේ

අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අරුත් ලියන්න.

ආ) කවියේ අර්ථය සරල බසින් ලියන්න.

3) ඝෝෂා සහිත කලබල වීථිවලින් තැතිගෙන සිටි පුංචි මැණිකා ජන ශූන්‍ය නිශ්චල ස්ථානයකට පැමිණීම ගැන ආනන්දිතව එහි ඇන තියා හිඳගත්තාය.

අ) මෙම පාඨයේ සරල අදහස ලියන්න.

ආ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් පැහැදිලි කරන්න.

4) *''අසිරිමත් වූ දේකී - මෙලොවේ ප්‍රේමය නමිනා*
*වැනූ* ***පොරණ කිවිඳුන්*** *සොඳ - රසමුසු බසිනා*
*සියලු බෝග වස්තු ඉසුරු - හරිති නෙත් දනෝ*
*සව්සැපදෙන* ***සිතුමිණ වන්*** *- ප්‍රේමය සන්දා''*

අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අරුත ලියන්න.

ආ) මෙහි උපමාව ඇතුළත් කවි පදය ලියන්න.

5) ***''ජාතික රණ දෙරණ මතේ - ගැටී වැටී මළ මොහොතේ***
***සුන්දර සුරඹුන්ගේ අතේ - නැළවෙන බව සිතනු පුතේ''***

අ) මෙහි ඇතුළත් අනුප්‍රාසාත්මක වදන් වෙන් කොට දක්වන්න.

ආ) මෙහි කියවෙන ව්‍යංග්‍යාර්ථය ලියා දක්වන්න.

**(ලකුණු 4x5=20යි)**

03. i) කේවට්ට බමුණා

ii) මහෝෂධ පඬිතුමා උපක්‍රමශීලිව කටයුතු කිරීම කතාවේ රසභාව තීව්‍ර කිරීමට හේතු වී ඇත. එක් කරුණකට නිදසුන් දෙක බැගින් ගෙන විමසීමක යෙදෙන්න.

**(ලකුණු 15යි)**

**නැතහොත්**

ගුත්තිල ඇදුරු තුමාගේ වීණා වාදනයෙන්

i) මිනිසුන්

ii) ***''තිරිසන් සතුන් යන දෙපිරිසම එක සේ චමත්කාරයට පත් වූහ.''*** එක් කරුණකට උදාහරණ දෙකක් සහිතව පැහැදිලි කරන්න.

**(ලකුණු 15යි)**

04. සුප්පා දේවියගේ චරිතයේ,

i) දරුවන්ගේ අනාගතය වෙනුවෙන් කැප වීම.

ii) තම සැමියාට දැඩි සේ ආදරය කිරීම යන සුවිශේෂි ලක්ෂණ හෙළිවෙයි. අදාළ පාඩමෙන් උදාහරණ දෙක බැගින් ගෙන සාකච්ඡා කරන්න.

**(ලකුණු 15යි)**

**නැතහොත්**

i) බැද්දේගම ගම්මානය

ii) එහි වැසියන් කෙමෙන් අභාවයට යන ආකාරය කතුවරයා මැනවින් නිරූපණය කොට ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විමසීමක යෙදෙන්න.

**(ලකුණු 15යි)**

**5,6,7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

05. ගංගාවේ සංගීතය පැදි පෙළෙන් කවියා ඉදිරිපත් කර ඇති ජීවන දර්ශනය පිළිබඳව උදාහරණ සහිතව විමසීමක යෙදෙන්න.

**(ලකුණු 10යි)**

06. මෙරට ළමා පරපුරට යුතුකම් වගකීම් පිළිබඳ පැහැදිලි කරදීමට සුදුසුම කවි පංතියකි ''මුණි සිරිපා සිඹිමින්නේ'' උදාහරණ තුනක්වත් ඇතිව පැහැදිලි කරන්න.

**(ලකුණු 10යි)**

07. අවවාද අනුශාසනා දීමේ දී ජන කවියා ඉතා සංයමයෙන් එම කටයුත්ත සිදු කොට ඇත. උදාහරණ තුනක්වත් ඇතුලත්ව පැහැදිලි කරන්න.

**(ලකුණු 10යි)**